MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper

අ.පො.ස. (සා / පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍ර

BUSINESS & ACCOUNTING STUDIES

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

# QUESTION PAPER - I

# ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I**

**අ.පො.ස. (සා/ පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය - පැය 1 යි**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු පසයන්න.
- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරු වලින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

පහත දී ඇති සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්ණ අංක 1 සිට 5 තෙක් පිළිතුරු සපයන්න.

උසස් පෙළ වාණිජ අංශයෙන් විභාග සමත් වූ රේණුකා විතානගේ විසින් ගමේ දේශීය ආහාර ද්‍රව්‍ය අලෙවිකිරීමේ අරමුණින් ඇය ඉගෙන ගත් ගමේ පාසල අසල ''ගමේ කඩේ'' නමින් අලෙවි සැලක් ආරම්භ කෙරිණි. එහි කොස් හා අල වර්ග වලින් ආහාර වර්ග සෑදීම ආරම්භ කල අතර තම සොහොයුරාගේ සහය ලබා ගනිමින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යයි.

1. මෙම සිද්ධියේ සඳහන් ''ගමේ කඩේ'' ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක්ද?
   I. ආහාර
   II. ඇඳුම්
   III. නිවාස
   IV. අධ්‍යාපනය

2. මෙම සිද්ධියේ ''ගමේ කඩේ'' ව්‍යාපාරයේ ව්‍යාපාර අවස්ථාවක් වන්නේ,
   I.රේණුකා විතානගේ උසස් පෙළ සමත්ව තිබීම
   II.පාසල ආසන්නයේ ව්‍යාපාරය පිහිටා තිබීම
   III.සොහොයුරා ව්‍යාපාරයට සම්බන්ධ කර ගැනීම
   IV. කොස් හා අල වර්ග ප්‍රදේශයේ බහුලව පැවතීම.

3. ''ගමේ කඩේ'' ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,
   I.ඒක පුද්ගල ව්‍යාපාර
   II.හවුල් ව්‍යාපාර
   III.සමිති සංවිධාන
   IV.ව්‍යවස්ථාපිත සමාගම්

4. ''ගමේ කඩේ'' ව්‍යාපාරයේ රේණුකා විතානගේ අයත් වන නිෂ්පාදන සාධකය කුමක්ද?
   I.භූමිය
   II.ශ්‍රමය
   III.ප්‍රාග්ධනය
   IV.ව්‍යවසායකත්වය

5. "ගමේ කඩේ" ව්‍යාපාරය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
 I.මෙම ව්‍යාපාරය ලියාපදිංචිය අනිවාර්ය නොවේ.
 II.මෙම ව්‍යාපාරයේ වගකීම සීමාසහිත වේ.
 III.මෙම ව්‍යාපාරය භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් වේ.
 IV.මෙම ව්‍යාපාරය සේවා සපයන ව්‍යාපාරයක් වේ.

වර්ථමානයේ බොහෝ දුරට භාණ්ඩ තෝරා ගැනීම වෙබ් අඩවි (Web sites) ඔස්සේ සිදු කෙරෙන අතර, ඇණවුම් කිරීම් ද විද්‍යුත් තැපැල (E mail) ඔස්සේ සිදු කර ගෙවීම් සිදු කිරීමේදී හරපත් හා ණයපත් (Debit Cards, Credit Cards) භාවිතා කරයි.

6. විද්‍යුත් තැපැල (E mail) සන්නිවේදන මාධ්‍ය අයත් වන්නේ කවර වර්ගයකටද?
 I.වාචික
 II.ලිඛිත
 III.විද්‍යුත්
 IV.සංකේත හා සංඥා

7. හරපත් (Debit Cards) සම්බන්ධ නිවැරදි පිළිතුර වන්නේ,
 I.වාණිජ බැංකු ණය පදනම මත ගණුදෙණු කිරීමට නිකුත් කරයි.
 II.හරපත් ලබා ගැනීම සඳහා බැංකු ගිණුමක් පැවතිය යුතුය.
 III.හරපත් සඳහා බැංකු ගිණුමක් අවශ්‍යම නොවේ.
 IV.ගිණුමේ මුදල් ශේෂය ඉක්මවා භාණ්ඩ මිලදී ගත හැකිය.

8. වර්තමානයේ අන්තර්ජාලය, විද්‍යුත් තැපැල වැනි දෑ භාවිතය අදාල වන්නේ කවර පරිසර සාධකයටද?
 I.ගෝලීය පරිසරය
 II.සංස්කෘතික පරිසරය
 III.ආර්ථික පරිසරය
 IV.තාක්ෂණික පරිසරය

9. පහත සඳහන් බැංකු අතරින් ජංගම ගිණුමක් ආරම්භ කල හැකි බැංකු ඇතුලත් පිළිතුර තෝරන්න.

(A) (B) (C) (D)

 I.A B C
 II.A B D
 III.B C D
 IV.A C D

10. චෙක්පත් පිටසන් කිරීම සම්බන්ධ සාවද්‍ය පිළිතුර තෝරන්න.
 I.චෙක්පත් මුහුණත සඳහන් ආදායකයාගේ නම ඒ ආකාරයටම ලිවීම.
 II.වෙනත් කෙනෙකුට පැවරීමේදී පිටසන් කරයි.
 III.චෙක්පතෙහි අත්සන් යෙදීම මින් අදහස් කරයි.
 IV.පිටසන් කිරීම මඟින් චෙක්පත පිළිබඳ අව්‍යාජ හිමිකමක් අයිතිකරුට පැවති බව ප්‍රකාශ කරයි.

11.රවින්ද්‍ර සිල්වා විසින් තම රථය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව යටතේ රු.100 000 කට රක්ෂණය කර ඇත. මෙහි පළමු පක්ෂය, දෙවන පක්ෂය, තෙවන පක්ෂය පිළිවෙලින් දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

I.රවින්ද්‍ර සිල්වා, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, පාරේ ගමන් කරන අයගේ වාහන හා මඟීන්

II.ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, රවින්ද්‍ර සිල්වා, පාරේ ගමන් කරන වාහන හා මඟීන්

III.පාරේ ගමන් කරන වාහන,රවින්ද්‍ර සිල්වා, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

IV.රවින්ද්‍ර සිල්වා, පාරේ ගමන් කරන වාහන හා මඟීන්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

12. හම්බන්තොට වරාය ..........①........ යන ප්‍රවාහන මූලිකාංගයට අයත් වන අතර, එහි නෞකාවන්ට අදාල ඉන්ධන ...........②......... මූලිකාංගයට අදාල වේ.

ඉහත ①,②යන ස්ථානයට අදාල යෙදුම් පිළිවෙලින් ඇතුළත් පිළිතුර තෝරන්න.

I.මාර්ගය, මාධ්‍යය

II.පරියන්තය, බලය

III.මාධ්‍යය, බලය

IV.මාර්ගය, පර්යන්තය

13. පහත ව්‍යාපාර අතරෙන් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් වනුයේ,

I.බේකරි හිමියෙකු පාසලේ ආපනශාලාවට බේකරි නිෂ්පාදන විකිණීම.

II.පුවත් පත් නියෝජිතයන්ගෙන් උප නියෝජිතයන්ට පුවත් පත් අලෙවි කිරීම.

III.දන්සැලක් සඳහා හාල් කිලෝ 50 ක් විකිණීම.

IV.අලෙවිය සඳහා “ලැප් ටොප්” පරිගණක 2 ක් මිලදී ගැනීම.

14. පහත X තීරුවට හා Y තීරුවේ වගන්ති ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| X | Y |
|---|---|
| 1. සැලසුම්කරණය | A.නිවැරදි ලෙස කාර්යයන් කිරීමට පෙළඹීම. |
| 2. සංවිධානකරණය | B.ව්‍යාපාරයේ අඩුපාඩු මගහරවා ගැනීම |
| 3. මෙහෙයවීම | C.කළමණාකරුවන්ට අවශ්‍ය සම්පත් ලබා ගැනීමට අවශ්‍ය |
| 4. පාලනය | D.සම්පත් ලබාගන්නා ආකාරය තීරණය කිරීම |

X තීරුවේ සඳහන් තොරතුරු Y තීරුව හා පිළිවෙලින් ගැලපූ විට ලැබෙන පිළිතුර වනුයේ,

I.D,C,A,B

II.C,D,A,B

III.B,A,C,D

IV.A,B,C,D

15. උත්සව සඳහා උත්සව භාණ්ඩ සැපයීමේ කාර්යයේ යෙදී සිටින "මෙවන් ආසිරි" ආයතනය නත්තල් සමය තුල විශේෂ මිල අඩු කිරීම් සහ වට්ටම් සහන ඇතිව ලබාදීමට සූදානම්ව සිටින බව, මෙවන්ගේ වෙබ් පිටුව මඟින් දැන්වීම් පල කර ඇත.

ඉහත සඳහන් ඉරි ඇඳි වගන්ති සඳහා දැක්වෙන අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් පිළිවෙලින් දැක්වෙන්නේ,

I.මිල, ස්ථානය

II.නිෂ්පාදනය, ස්ථානය

III.මිල, ප්‍රවර්ධනය

IV.ස්ථානය, ප්‍රවර්ධනය

16. සාමාන්‍ය කොටස් ආයෝජනය තුලින් ලැබෙන ප්‍රතිලාභයක් නොවන්නේ කුමක්ද?

I.මිලදී ගත් කොටස් සඳහා ලාභාංශ ලැබීම.

II.ණය ලබාගැනීමේදී සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකිවීම.

III. සාමාන්‍ය කොටස් ගත්මිලට වඩා වැඩි වටිනාකමකට විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ ලබාගත හැකිවීම.

IV.කොටස් සඳහා ඉහළ පොලී ලැබීම.

17. වත්කම් හා වගකීම් යන දෙකටම පොදු ලක්ෂණයක් ලෙස සැලකිය හැකි පිළිතුර කුමක්ද?

I.අනාගතයේදී බේරුම් කිරීමේදී මුදල් පිටතට ගලායෑම.

II.අතීත ගණුදෙණුවක ප්‍රතිඵලයක් ලෙස ඇති වීම.

III.ව්‍යාපාරයට වර්තමාන බැඳීමක් තිබීම.

IV.ව්‍යාපාරයේ පාලනයට යටත් වීමය.

18. පහත සඳහන් ගණුදෙණු අතරින් හිමිකම වැඩිවීමට බලපාන ගණුදෙනුව වන්නේ,

I.රු. 4000 ක් විදුලි ගාස්තු ගෙවීම

II.රු. 5000 කඩකුලී ආදායම ලැබීම

III.5% ක වට්ටමකට යටක්ව ණයගැතියන්ගෙන් මුදල් ලැබීම

IV.අයිතිකරු රු. 1000 ක් ගැනිලි ගැනීම.

**පහත තොරතුරු අනුව 19 හා 20 ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.**

නාමල්ගේ ව්‍යාපාරයේ රු.10 000 ණයට විකුණුම් සිදු කල අතර අඩුකල වෙළඳ වට්ටම 10%කි. මුදල් ලැබීමේ දී 10%ක මුදල් වට්ටමක් දෙන ලදි.

19. ඉහත ගණුදෙණු නාමල්ගෙන් ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයේ දැක්වූ විට හිමිකමට වන බලපෑම වන්නේ,

I.රු. 10 000 කින් වැඩිවීම.

II.රු. 1 000 කින් අඩුවීම.

III.රු. 900 කින් අඩුවීම.

IV.රු. 900 කින් වැඩිවීම.

20. ව්‍යාපාරයට මුදල් ලැබීම සම්බන්ධ නිවැරදි ද්විත්ව සටහන කුමක්ද?

| | | | |
|---|---|---|---|
| I.මුදල් ගිණුම | හර | 9 000 | |
| ණයගැති ගිණුම | බැර | | 8 100 |
| දුන් වට්ටම් ගිණුම | බැර | | 900 |
| II.මුදල් ගිණුම | හර | 10 000 | |
| ණයගැති ගිණුම | බැර | | 9 000 |
| දුන් වට්ටම් ගිණුම | බැර | | 1 000 |
| III.මුදල් ගිණුම | හර | 8100 | |
| දුන් වට්ටම් ගිණුම | හර | 900 | |
| ණයගැති ගිණුම | බැර | | 9 000 |
| IV.මුදල් ගිණුම | හර | 9 100 | |
| දුන් වට්ටම් ගිණුම | බැර | | 9 000 |

21. පහත X තීරුව හා Y තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| X | Y |
|---|---|
| I. විකුණුම් ගිණුම | A. හිමිකම් ගිණුම |
| II. ගැනිලි ගිණුම | B. ආදායම් ගිණුම |
| III. රක්ෂණ ගාස්තු ගිණුම | C. වියදම් ගිණුම |
| IV. උපචිත වැටුප් ගිණුම | D. වගකීම් ගිණුම |

X තීරුව හා Y තීරුව පිළිවෙලින් ගැලපූ විට පිළිතුර වන්නේ,

I.B,A,C,D
II.A,C,D,B
III.C,A,D,B
IV.C,D,A,B

**සඳරුවන්ගේ ව්‍යාපාරයට රු. 10 000 වටිනා උපකරණ තොගයක් ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා ණයට ගන්නා ලදි.**

22. ඉහත ගණුදෙණුව සටහන් කිරීමට අදාල මූලාශ්‍ර ලියවිල්ල හා මූලික පොත නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

I.ඉන්වොයිසිය, පොදු ජ'නලය
II.ඉන්වොයිසිය, ගැණුම් ජ'නලය
III.ජ'නල් වවුචරය, පොදු ජ'නලය
IV.මුදල් ගෙවීම් වවුචරය, මුදල් පොත

**2019 අගෝස්තු 30 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 6 700 කි. පහත සඳහන් හේතූන් නිසා බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස් විය.**

A - ඉදිරිපත් කළ කල නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 2 000

B - බැංකුවට සෘජුවම ලැබී ඇති ණයගැති ප්‍රේෂණ රු. 500

C - ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්ෂණ ගාස්තු රු. 1 000

23. ඉහත කරුණු අතරින් බැංකු ගිණුමේ ශේෂය,බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා අඩු වීමට බලපාන හේතුව/ හේතු වන්නේ,
    I. A පමණි
    II. B පමණි
    III. C පමණි
    IV. A,C පමණි

24. 2019 අගෝස්තු 30 දිනට සංශෝධිත බැංකු ශේෂය
    I.රු. 6 200
    II.රු. 4 200
    III.රු. 7 200
    IV.රු. 8 200

25. සුළු මුදල් “අග්‍රිමය ප්‍රතිපූර්ණය” යනුවෙන් අදහස් වන්නේ,
    I.කාලච්ඡේදයට අයත් මුදල ලබා දීම.
    II.කාලච්ඡේදයේ වියදම කල මුදලට සමාන මුදලක් ලබා දීම.
    III.කාලච්ඡේදයේ ඉතිරි මුදලට සමාන මුදලක් ලබා දීම.
    IV.කාලච්ඡේදයේ ඉල්ලුම් කරන මුදල් ප්‍රමාණය ලබාදීම.

26. රවිලාල්ගේ ව්‍යාපාරයේ අගෝස්තු මාසයේ වියදම රු. 2 800 කි. ඔහු සතුව මාසය අවසානයේ ඉතිරි ශේෂය රු. 1 200කි. සැප්තැම්බර් 1 දිනට ප්‍රතිපූර්ණය සඳහා ලද මුදල හා සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම පිළිවෙලින් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක්ද?
    I.රු.2 800 හා රු.1 200
    II.රු.1 200 හා රු.2 800
    III.රු.2 800 හා රු.4 000
    IV.රු.1 200 හා රු.4 000

27. රු. 1 000 ක ණයහිමියෙකුට ගෙවන ලද චෙක්පත් බැංකුව විසින් අහරු බව දන්වා එවා තිබිණි. එය ගිණුම් ගත කිරීමට අදාල ද්විත්ව සටහන වන්නේ,
    I.මුදල් ගිණුම හර රු.1 000, ණයහිමි ගිණුම බැර රු.1 000
    II.ණයහිමි ගිණුම හර රු.1 000, බැංකු ගිණුම බැර රු.1 000
    III.ණයහිමි ගිණුම හර රු.1 000, මුදල් ගිණුම බැර රු.1 000
    IV.බැංකු ගිණුම හර රු.1 000, ණයහිමි ගිණුම බැර රු.1 000

පහත දැක්වෙන්නේ ගිණුම්කරණයේදී සිදු වූ වරදක් නිවැරදි කිරීමට අදාල ජ'නලය සටහනකි.

ගැණුම් ගිණුම හර 1 000

ගැනිලි ගිණුම බැර 1 000

28. ව්‍යාපාරය ගිණුම් තැබීමේදී සිදු වී ඇති වරද වන්නේ

I.ගැණුම් රු.1 000 ගැනිලි ගිණුමට හර කර තිබීම

II.ගැනිලි ගිණුමේ රු.1 000 සටහන් කර තිබීම

III.ගැනිලි ගිණුමේ රු.1 000 සටහන් නොවීම

IV.ගැණුම් රු.1 000 සම්පූර්ණයෙන් පොත් වලින් මඟ හැරීම

29. "තරුණ සවිය" ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් සංඛ්‍යාව 50 කි. සාමාජික මුදල් ලැබී ඇත්තේ රු.4 000 කි. සාමාජිකයෙකුගේ ගාස්තුව රු.100 කි.

වර්ෂික **සාමාජික මුදල් ආදායම හා ලැබීම් හා ගෙවීම්** ගිණුමේ සටහන් කල යුතු මුදල පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

I.රු.4 000 හා රු.5 000

II.රු.5 000 හා රු.4 000

III.රු.5 000 හා රු. 5 000

IV.රු.1 000 හා රු.4 000

30. පහත සඳහන් X තීරුව හා Y තීරුවට පිළිවෙලින් ගැළපෙන පිළිතුර කුමක්ද?

| X | Y |
|---|---|
| 1. ඇඳුම් නිෂ්පාදන ආයතනයේ රෙදි වියදම | A. සෘජු වෙනත් |
| 2. ඇඳුම් නිෂ්පාදන ආයතනයක මුරකරු වැටුප | B. සෘජු ශ්‍රමය |
| 3. ඇඳුම් නිෂ්පාදනයේ සේවිකාවගේ වැටුප | C. සෘජු ද්‍රව්‍ය පිරිවැය |
| 4. ඇඳුම් නිෂ්පාදන ආයතනය මෝස්තර නිර්මාණකරුගේ වැටුප | D. වක්‍ර පිරිවැය |

I.D,C,A,B

II.B,D,C,A

III.A,B,D,C

IV.C,D,B,A

31. මුළු නිෂ්පාදන පිරිවැය දැක්වෙන නිවැරදි පිළිතුර කුමක්ද?

I.සෘජු ද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය +සෘජු වෙනත්+ නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

II.ප්‍රාථමික පිරිවැය + සෘජු ශ්‍රමය + නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

III.ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය + සෘජු වෙනත් පිරිවැය

IV.නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය + වක්‍ර පිරිවැය + ප්‍රාථමික පිරිවැය+සෘජු ශ්‍රම පිරිවැය

32. 2016/1/1 දින මෝටර් රථයක් රු.99 000 කට මිලදී ගත් අතර ඵලදායි ජීවිත කාලය 10 කි. සුන්බුන් වටිනාකම රු.9 000 කි.

2018/12/31 දිනට ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දැක්විය යුතු ක්ෂය ප්‍රමාණය වන්නේ,

I. රු. 18 000 කි
II. රු. 9 000 කි
III. රු. 9 900 කි
IV. රු. 19 800 කි

33. විරාන්ගේ ව්‍යාපාරයේ 2018/12/31 දිනට බැංකු ණය පොලිය රු.9 000 ගෙවා තිබුණු අතර මාසික පොලිය රු.1 000 කි. මෙම ව්‍යාපාරයේ 2018/12/31 වන විට

I. ගෙවූ බැංකු ණය පොලී ගිණුමේ ශේෂය රු.1 000 කි.
II. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උපචිත බැංකු ණය පොලී රු.3 000 කි.
III. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උපචිත බැංකු ණය පොලී රු.12 000 කි.
IV. බැංකු ණය පොලී ගිණුමේ ශේෂය රු.10 000 කි.

පහත සඳහන් තොරතුරු උපයෝගි කරගෙන 33 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මාලනීගේ ව්‍යාපාරයේ2018/12/31 දිනට ශේෂ පිරික්සුමෙන් උපුටා ගත් තොරතුරු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ප්‍රාග්ධනය | 300 000 |
| ගැණුම් | 150 000 |
| විකුණුම් | 300 000 |
| ලද වට්ටම් | 5 000 |
| විදුලි වියදම් | 15 000 |
| ප්‍රචාරණ වියදම් | 5 000 |
| රක්ෂණ වියදම් | 10 000 |
| ණයගැතියෝ | 40 000 |
| ණයහිමියෝ | 25 000 |
| මුදල් | 40 000 |
| බැංකු අයිරාව | 10 000 |
| 10% බැංකු ණය | 60 000 |
| මෝටර් රථ | 250 000 |
| ගෙන ඒමේ කුලී | 10 000 |
| බැංකු ණය පොලී | 3 000 |

අතිරේක තොරතුරු

- මෝටර් රථ 10% ක්ෂය කල යුතුය.
- 2018/12/31 දිනට තොග රු.20 000 කි.

34. 2018/12/31 දිනෙන් අවසන් වර්ෂයේ විකුණුම් පිරිවැය
   I. රු.140 000
   II. රු.130 000
   III. රු.170 000
   IV. රු.160 000

35. 2018/12/31 දිනෙන් අවසන් වර්ෂයේ දළ ලාභය වන්නේ,
   I. රු.140 000
   II. රු.130 000
   III. රු.160 000
   IV. රු.170 000

36. මෙම ව්‍යාපාරයේ බෙදාහැරීමේ වියදමක්, පරිපාලන වියදමක්, මූල්‍ය වියදමක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
   I. ප්‍රචාරණ වියදම්, බැංකු ණය පොලී, රක්ෂණ වියදම්
   II. ප්‍රචාරණ වියදම්, රක්ෂණ වියදම්, බැංකු ණය පොලී
   III. විදුලි වියදම්, රක්ෂණ වියදම්, බැංකු ණය පොලී වියදම්
   IV. බැංකු ණය පොලී,විදුලි වියදම්,ප්‍රචාරණ වියදම්

37. මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වන්නේ,
   I. රු.690 00
   II. රු.109 000
   III. රු.104 000
   IV. රු.107 000

38. මෙම ව්‍යාපාරයේ 2018/12/31 දිනට මෝටර් රථ වල ශුද්ධ අගය වන්නේ,
   I. රු.200 000
   II. රු.250 000
   III. රු.225 000
   IV. රු.200 000

39. මෙම ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු උපචිත බැංකු ණය පොලිය වන්නේ,
   I. රු.1 000
   II. රු.3 000
   III. රු.6 000
   IV. රු.9 000

40. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුත්තේ මූළ වගකීම වන්නේ,
   I. රු.38 000
   II. රු.88 000
   III. රු.95 000
   IV. රු.98 000

**MINISTRY OF EDUCATION**

අධ්‍යාපන අමාත්‍යාංශය

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

අ.පො.ස. (සා / පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍ර

**BUSINESS & ACCOUNTING STUDIES**

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

# QUESTION PAPER - II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

# අධ්‍යාපන අමාත්‍යාංශය

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

## අ.පො.ස. (සා/ පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 02 යි**

2.10(අමතර කියවීමේ කාලය මි.10)

- **වැදගත් :** උපදෙස් දී ඇති පරිදි පළමු වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවලදී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද** බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (I) සිට (X) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උසස්පෙළ වානිජ අංශයෙන් විභාගය සමත් වූ තාරකා විජේරත්න නිර්මාණශීලී, කඩිසර අයෙකි.ඇය පදිංචි මහියංගනයට ගමේ ඇති පොල් අතු හා පුවක් අතු මගින් විසිතුරු බෑග් හා ආහාර දවටන නිපදවා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් "හරිත නිපයුම්" නමින් ආරම්භ කෙරිනි. එම නිපයුම් ව්‍යාපාරයේ 2019 ඔක්තොම්බර් 01 වන දිනට පහත ගිණුම් ශේෂ පැවතුනි.

| | රු |
|---|---|
| අයිතිකරු යෙදූ මුදල් | 100 000 |
| ඇය යෙදූ උපකරණ | 10 000 |

2019 ඔක්තොම්බර් 31 දිනෙන් අවසන් මාසය තුළදී පහත ගනුදෙනු සිදුවිය.

| | රු |
|---|---|
| අමු ද්‍රව්‍ය ගැනුම් | 50 000 |
| ණයට ගැනුම් | 20 000 |
| අත්පිට විකුනුම් | 150 000 |
| ණයට විකුනුම් | 50 000 |
| වැටුප් | 20 000 |
| විදුලි වියදම | 30 000 |

මෙම නිෂ්පාදිත 'අපනයන සංවර්ධන මණ්ඩලය' මගින් සංවිධානය කරන ලද ප්‍රදර්ශනයකට ඉදිරිපත් කළ අතර එහිදී ගැනුම්කරුවන් විදේශීය ලෙස හඳුනාගෙන විද්‍යුත් තැපැල(E-mail) මගින් ඇනවුම් කර ඇත. ප්‍රවාහන කටයුතු සඳහා රු 300 000 කුඩා ලොරි රථයක් ණයට කුරේ සමාගමෙන් ගත්තාය. ඉල්ලුම වැඩි වූ විට ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැති බැවින් රු 200 000 බැංකු ණයක් 2019 ඔක්තොම්බර් 15 දින ගත් අතර එහි වාර්ෂික පොළී අනුපතය 12% කි. රජය විසින් පොලිතින් ප්ලාස්ටික් නිෂ්පාදන සම්බන්ධයෙන් සීමා පැනවීමට තීරණය කර ඇත. එමෙන්ම අවසානයේ ඉතිරි තොග ලෙස රු 2000 කට තක්සේරු කෙරිණි.

I. ඉහත සිද්ධියේ "හරිත නිපයුම්" ව්‍යාපාරය කවර ව්‍යාපාර සංවිධානයකට අයත් ද?

II. මෙම ව්‍යාපාරයේ **තාරකා** කවර නිෂ්පාදන සාධනයට අයත් වේද?

III. "හරිත නිපයුම්" ව්‍යාපාරයේ ශක්තියක් හා අවස්ථාවක් දක්වන්න.

IV. අ. පහත සඳහන් ප්‍රකාශ අලෙවි මිශ්‍රණයේ කුමන විචල්‍යකට අයත්වේද?

1)පොල් අතු හා පුවක් අතු මගින් නිෂ්පාදන සැකසීම

2)අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රදර්ශනයකට නිෂ්පාදන ඉදිරිපත් කිරීම.

ආ. "හරිත නිපයුම් ව්‍යාපාරයට අදාල උපකාරක සේවා 2ක් උදාහරණ සහිතව දක්වන්න.

V. අ.'හරිත නිපයුම්' ව්‍යාපාරය වගකීම් සීමිත ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කල යුතු යැයි **තාරකා** සිතයි.එය ලියාපදිංචි කල යුත්තේ කෙසේද?

ආ. 'හරිත නිපයුම් ව්‍යාපාරයේ 2019 ඔක්තොම්බර් 01 වන දිනට හිමිකම කීයද?

VI. 'හරිත නිපයුම්' ව්‍යාපාරයේ සෘජු පිරිවැයක් හා වක්‍ර පිරිවැයක් වටිනාකමක් සහිතව ලියන්න.

VII. ව්‍යාපාරයේ පොදු ජනලය පිළියෙල කරන්න.

VIII. අ. 'හරිත නිපයුම්' ව්‍යාපාරයේ 2019/10/31 දිනට මුදල් ශේෂය කොපමනද?

ආ. මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වගකීමක් හා ජංගම වගකීමක් වටිනාකම් සහිතව ලියන්න.

IX. ව්‍යාපාරයේ ශුද්ධ ලාභය ගණනය කරන්න.

අ. ව්‍යාපාරයේ හිමිකම් ගිණුමක් හා ආදායම් ගිණුමක් සඳහා නිදසුනක් බැගින් දෙන්න.

ආ. ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම් හා එහි වටිනාකම් දක්වන්න.

## I කොටස

## ව්‍යාපාර අධ්‍යයනය

## (ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

2.

I. **අ.** මිනිස් අවශ්‍යතා හා වුවමනා යනු කුමක්ද?

**ආ.**මිනිස් අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් 02 බැගින් ලියන්න.

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

**අ.** අනාගත ආයෝජනයන් ආයෝජනයේ සුරක්ෂිත බව පිළිබඳ උනන්දුවක් දක්වන අතර අයිතිකරු සාධාරණ වැටුප් ලබාගැනීමට උනන්දුවක් දක්වයි.

**ආ.** නැවත විකිණීමේ චේතනාවෙන් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම තොග වෙළඳාමයි.

ඇ.ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයිතිකරුවන්, සේවායන් කළමණාකරුවන් හා පාරිභෝගිකයන් ඇතුළත් වේ.

ඈ.හිමිකාරත්වය අනුව ව්‍යාපාරයේ පෞද්ගලික හා පොදු ලෙස අංශ දෙකකට බෙදා දක්වයි.

III. නිර්මාණශීලී පුද්ගලයෙක් වූ විකුම් අලිගැට පේර ඇට වලින් මාස 10ක කාලයක් පාවිච්චි කල හැකි හැදි නිර්මාණයට අත්හදා බැලීමක් කරයි. ඒ සඳහා නවින්ගේ සහය ලබා ගනී. උපකරණ ගැනීමට රු 20 000ක ප්‍රාග්ධනයක් යොදවා ඇත.

අ. මෙහි ඇතුළත් නිෂ්පාදන සාධක 02ක් උදාහරණ සහිතව දක්වන්න.

ආ. අයිතිකරු වූ විකුම්ගේ අරමුණු 02ක් දක්වන්න.

IV. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට මුහුන දීමට සිටින පහන්ගේ ජාතික හැඳුනුම්පත තවමත් ලැබී නොමැති අතර පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව කඩිනම් කර නිකුත් කරන බව ප්‍රවෘත්ති ප්‍රකාශය මඟින් දැනුම් දී ඇත. ජාතික හැඳුනුම්පත අවශ්‍ය බව විභාග දෙපාර්තමේන්තුව නිවේදනය නිකුත් කර ඇත.

අ. මෙහි සඳහන් සංවිධාන වර්ගයක් නම් කර අරමුණු අනුව කවර වර්ගයකට අයත් දැයි දක්වන්න.

ආ. ඔබ සඳහන් කර සංවිධාන වර්ගයේ පහත ලක්ෂණ කවරේදැයි දක්වන්න.

- පැවැත්ම -
- අයිතිය -

3.

I. අ.චෙක්පත් රේඛනය කිරීම යනුවෙන් කුමක් අදහස් වේද?

ආ.රක්ෂණ මූලධර්ම 02ක් දක්වන්න.

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ.'සිගේරා' විසින් ලීසිං ක්‍රමයට ගත් රථ වාහනය රක්ෂණය කිරීමට ඔහුට අයිතියක් ඇත.

ආ. මාධ්‍ය, බලය, පර්යන්තය සහ මාර්ගය ප්‍රවාහනය මූලිකාංග වේ.

ඇ. සන්නිවේදනය යනු විවිධ පාර්ශවයන් අතර විවිධ මාධ්‍ය හරහා පණිවුඩ, තොරතුරු, අදහස් හුවමාරු කිරීමයි.

ඈ. පිරිවැය ලේඛන සැකසීම පරිගණකයේ පැතුරුම්පත් මගින් කල නොහැක.

III. ව්‍යාපාර කටයුතු කරගෙන යන සුමනසිරිගේ ජංගම ගිණුමේ ඇත්තේ රු 70 000 පමණි. එහෙත් ඔහු විසින් රු 100 000ක ගෙවීමක් සිදු කරයි.

අ. මෙම ගෙවීම් හඳුන්වන නම කුමක් ද?

ආ. එහි වටිනාකම කොපමණ ද?

IV. සිරිමෙවන් අසනීප වූ විට 'සුව සහන රෝහලින් ' ප්‍රතිකාර ලබා ගත්තේය.

අ. සිරිමෙවන්ගේ රෝහල් ගාස්තුව ගෙවිය හැකි විද්‍යුත් මාධ්‍යන් 02ක් නම් කරන්න.

ආ. සිරිමෙවන්ට වෛද්‍ය සේවාව ලබා ගත හැකි රාජ්‍ය ආයතනයක් නම් කරන්න.

4.

I. අ. සඵලදායකත්වය යනු කුමක්ද?

**ආ.** කළමනාකරණ කාර්යයන් හඳුන්වන්න.

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

**අ.** අවම සම්පත් ප්‍රමාණයකින් උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි සම්පත් භාවිතා කිරීම කාර්යක්ෂමතාවයයි.

ආ.භාණ්ඩාගාර බිල්පත් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන කෙටිකාලීන සුරැකුම්පත් වර්ගයකි.

ඇ. පුද්ගලයකු උපයන ආදායමින් ඉතිරිකරගත මුදල් යම් ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂාවෙන් තමා ලඟ තබා ගැනීම ආයෝජනයයි.

ඈ. මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වටිනාකමින් යුත් නිෂ්පාදනයක් නිර්මාණය කිරීමේ හා පිළිගැන්වීමේ ක්‍රියාවලිය අලෙවිකරණයයි.

III. අ. පහත සඳහන් කළමනාකරණ ක්‍රියාවලියන්ට අදාල කළමනාකරණ කාර්යයන් ලියන්න.

A.ආහාර නිෂ්පාදන ව්‍යාපාරයක එක් එක් අංශයට අදාල කළමනාකරුවන්ට අවශ්‍ය සම්පත් හා සේවාවන් ලබා දීම.

B.ව්‍යාපාරයකට අවශ්‍ය ප්‍රාග්ධනය ලබාගන්නා ආකාරය තීරණය කිරීම.

C.ව්‍යාපාරයක අයිත්කරු විසින් තම සේවකයන්ට අදාල කාර්යයන් ඉටු කිරීම පිළිබඳ උපදෙස් සැපයීම.

D.ව්‍යාපාරයක සැලසුම්කර පරිදි අලවි කටයුතු සිදු නොවූ අතර ඒ පිළිබඳ හේතු කවරේදැයි සොයා බැලීම.

ආ.ව්‍යාපාරයකට වඩාත් ආකර්ශනීය ලෙස මෙන්ම ලාභදායීව තෘප්තිමත් කළ හැකි පාරිභෝගිකයන්ගෙන් සමන්විත වෙළඳපොල කොටස කුමක් ද?

IV. විසිතුරු <u>කඩදාසි බෑග්</u> නිෂ්පාදනය කරන පියල් උත්සව සමයේ <u>10% වෙළඳ වට්ටමකට</u> නිෂ්පාදන සපයන බව <u>වෙබ් අඩවිය</u> මගින් දැනුම් දී ඇත. එය <u>කොළඹ අවට ප්‍රදේශ</u> වලින් ලබාගත හැකි බවද දන්වා ඇත.

අ. මෙහි ඉරි ඇඳි පදවලට අදාල අලෙවිකරණ මිශ්‍රයන් නම් කරන්න.

ආ. සුදුසු ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධක 02ක් ලියන්න.

## II කොටස

## ව්‍යාපාර අධ්‍යයනය

## (ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

5.

I. අ. වත්කමක ලක්ෂණ 02ක් දක්වන්න

ආ. මූලික ගිණුම්කරණ සමීකරණ දක්වන්න

II. සීමන්ගේ ව්‍යාපාරයේ සිදුවූ ගනු දෙනු කීපයක් ඔබට දී ඇත.

- තැපැල් ගාස්තු රු 70 ගෙවීමට.
- සංග්‍රහ වියදම රු 100 ගෙවීම.

ඉහත ගනුදෙනු සටහන් කිරීමට අදාල මූලික පොත හා මූලාශ්‍ර ලියවිලි කවරේද?

III. ව්‍යාපාරයක 2019 ජනවාරි 01 දිනට වත්කම් වගකීම් හිමිකම් ශේෂ පළමු සතිය තුල සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණය යටතේ පහත දැක්වේ.

| | වත්කම් (රුපියල්) | = | හිමිකම්(රුපියල්) | වගකීම |
|---|---|---|---|---|
| 2019/01/01 ශේෂ | 300 000 | = | 200 000 | 100 000 |
| 2 | + 50 000 (මුදල්) | = | - | +50 000 (බැංකු ණය) |
| 3 | + 20 000 (තොගය) | = | | 20 000 (ණය හිමියෝ) |
| 4 | -5 000 (මුදල්) | = | -5 000 (කඩ කුලී) | |
| 5 | - 20 000 (තොගය) | = | + 5 000 (ලාභය) | |
| | + 25 000 (මුදල්) | = | | |

අවශ්‍ය වන්නේ,

අ. ඉහත එක් එක් ගනුදෙනුව අගයයන් සහිතව ලිවීම.

ආ. පහත සඳහන් දෑ වල අගයන් දක්වන්න.

මුළු වත්කම්, මුළු වගකීම්, මුළු හිමිකම්.

IV) ව්‍යාපාරයක ගිණුම් තැබීමේ දී සිදු වූ වැරදි නිවැරදි කිරීම සඳහා තබා තිබූ ජ'නල සටහන් පහත දැක්වේ.

**පොදු ජ'නලය**

| දිනය | වවුචර් අංක | විස්තරය | ලෙ පිටපත | හර(රු) | බැර(රු) |
|---|---|---|---|---|---|
| 2019/08/31 | 200 | වැටුප් ගිණුම(හර) | | 50 000 | |
| | | මුදල් ගිණුම(බැර) | | | 50 000 |
| 01 | | (.......................................) | | | |
| | 201 | විදුලි උපකරණ (හර) | | 20 000 | |
| | | විදුලි උපකරණ අළුත්වැඩියාව | | | 20 000 |
| 02 | | (.......................................) | | | |

අවශ්‍ය වන්නේ,

අ) ඉහත වැරදි නිවැරදි කිරීම්වලට අදාල සංලක්ෂය ලිවීම.

ආ) ලෙජරයට පිටපත් කිරීම.

6.

I. අ. බැංකු සැසඳුම් විස්තරය යනු කුමක්ද?

ආ. සංශෝධිත බැංකු ගිණුමේ අයිතම 02ක් ලියන්න.

II. මල් පෝච්චි නිෂ්පාදනය කරන වීරමන්ගේ 2019 සැප්තැම්බර් මාසයේ තොරතුරු කීපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| සිමෙන්ති සහ වැලි සඳහා | රු 90 000 |
| වැඩකුලී | රු 30 000 |
| විදුලිය හා ජල ගාස්තුව | රු 8 000 |
| වෙනත් සෘජු වියදම් | රු 2 000 |
| බිම් කුලිය | රු 10 000 |

නිෂ්පාදනය කල මල්පෝච්චි 1 400කි. මල් පෝච්චියක විකුණුම් මිල රු 150/= කි.

අවශ්‍ය වන්නේ,

අ.සැප්තැම්බර් මාසයේ ප්‍රාථමික පිරිවැය.

ආ.මල් පෝච්චියක් විකිණීමෙන් ලැබෙන ආදායම.

III. රවින්ද්‍රගේ ව්‍යාපාරයේ 2019/06/30 දිනට පිළියෙල කල ශේෂපිරික්සුම සමාන නොවූ බැවින් වෙනස අවිනිශ්චිත ගිණුමට මාරු කරන ලදී.

පහත දැක්වෙන්නේ ගිණුම්කරණ වැරදි නිවැරදි කල පසු පිළියෙල කල අවිනිශ්චිත ගිණුමයි.

හර බැර

| දිනය | විස්තරය | ස/ප | වටිනාකම (රු) | දිනය | විස්තරය | ස/ප | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | A ගැනුම් ගිණුම<br>B ලද වට්ටම් ගිණුම | | 14 000<br>6 000 | | ශේෂ පිරික්සුමේ වෙනස<br>C රක්ෂණ ගාස්තු ගිණුම<br>D යන්ත්‍ර ගිණුම | | ...............<br>4 000<br>10 000 |

අවශ්‍ය වන්නේ

1)වැරදි නිවැරදි කිරීමට පෙර ශේෂ පිරික්සුමේ වෙනස

2)සිදුවී ඇතැයි සැලකෙන වැරදි මොනවාද?

IV. 2019/08/31 දිනට නාමලීගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හර ශේෂය රු 21 000කි. එදිනට බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය එම ශේෂයට නොගැලපුනි.

මාසය තුල නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් වටිනාකම රු 8 000

මාසය තුල තැන්පත් කල උපලබ්දි නොවූ චෙක්පත් වටිනාකම රු 5 000

බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකු ගාස්තු රු 500

බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකුවට සෘජුව ලද ප්‍රේෂණ රු 2 000

අවශ්‍ය වන්නේ,

අ. 2019/08/31 දිනය ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.

ආ. 2019/01/31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම.

7.

I. අ. මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයක ඇතුලත් කරන මූලිකාංග 02ක් දක්වන්න.

ආ. ව්‍යාපාරයක බොල්ණය සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න.

II. උදාන ක්‍රීඩා සමාජයේ වර්ෂය තුල සිදුවූ ගනුදෙනු සම්බන්ධ 2019/06/30 දිනෙන් අවසන් වර්ෂයේ පිළියෙල කල අසම්පූර්ණ ලැබීම් හා ගෙවීම් ගිණුම් ආදායම් ප්‍රකාශයක් පහත දැක්වේ. එහි සාමාජික සංඛ්‍යාව 50කි. වාර්ෂික සාමාජික ගාස්තුව රු 1 000කි.

**උදාන ක්‍රීඩා සමාජයේ 2019/06/30 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම**

| | රු | | රු |
|---|---|---|---|
| සාම්ජික මුදල් | A | ගමන් ගැස්තු | 4 000 |
| ටිකට් පත් අලවියේ ලැබීම් | 10 000 | විදුලි වියදම් | 6 000 |
| | | උත්සව වියදම් | 10 000 |

**උදාන ක්‍රීඩා සමාජයේ 2019/06/30 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| | රු |
|---|---|
| <u>ආදායම</u> | |
| සාමාජික ගාස්තු | B |
| ටිකට් පත් අලෙවියෙන් ලද ආදායම | C |
| <u>වියදම්</u> | |
| ගමන් ගාස්තු | 5 000 |
| විදුලි වියදම් | D |
| උත්සව වියදම් | 10 000 |

- සාමාජිකයන් 10 දෙනෙකු වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා නැත.
- 2019/06/30 දිනට උපචිත විදුලි වියදම් රු 1 000 කි.
- ටිකට්පත් අලවියෙන් ලැබිය යුතු මුදල රු 5 000 කි.

අවශ්‍ය වන්නේ,

අ. A B C D ස්ථාන සඳහා නිවැරදි වටිනාකම

ආ. 2019/06/30 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සමාජයේ ඌනතාවය හෝ අතිරික්තය

නුවන්ගේ ව්‍යාපාරයේ 2018/12/31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ

| | හර (රුපියල්) | බැර(රුපියල්) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 200 000 |
| ගැනුම් | 80 000 | |
| 2018/01/01 තොගය | 4 000 | |
| විකුණුම් | | 120 000 |
| ණය ගැතියෝ | 30 000 | |
| ණය හිමියෝ | | 30 000 |
| වරිපනම් | 6 000 | |
| විදුලි ගාස්තු | 5 000 | |
| දුන් වට්ටම් | 4 000 | |
| ලද වට්ටම් | | 6 000 |
| ගෙනඒමේ කුලී | 2 000 | |
| වේතන | 8 000 | |
| මුදල් ශේෂය | 12 000 | |
| 10% බැංකු ණය | | 10 000 |
| ලී බඩු උපකරණ (පිරිවැයට) | 50 000 | |
| ලී බඩු උපකරණ ක්ෂය වෙන් කිරීම් | | 5 000 |
| ඉඩම් හා ගොඩනැගිලි | 170 000 | |
| | 37 1000 | 371 000 |

අමතර තොරතුරු,

- 2018/12/31 දිනට තොගය රු 6 000.
- උපකරණ සරල මාර්ග ක්‍රමයට වාර්ෂකව 10% ක්ෂය කෙරේ.
- ණය ගැතියන්ගෙන් රු 2 000 බොල්ණය කපා හැරීම.

අවශ්‍ය වන්නේ,

අ. 2018/12/31 න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය.

ආ. 2018/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper (ANSWERS)**

**අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය(පිළිතුරු)**

**BUSINESS & ACCOUNTING STUDIES**

# QUESTION PAPER (ANSWERS)- I , II

# ප්‍රශ්න පත්‍රය(පිළිතුරු)- I , II



අනුග්‍රහය :

# අධ්‍යාපන අමාත්‍යාංශය

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I

## අ.පො.ස. (සා/ පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය (පිළිතුරු)

**11 ශ්‍රේණිය**

| | |
|---|---|
| 01 | i |
| 02 | ii |
| 03 | I |
| 04 | iv |
| 05 | iii |
| 06 | iii |
| 07 | ii |
| 08 | iv |
| 09 | iv |
| 10 | iii |

| | |
|---|---|
| 11 | i |
| 12 | Ii |
| 13 | iii |
| 14 | i |
| 15 | iii |
| 16 | iv |
| 17 | ii |
| 18 | ii |
| 19 | iii |
| 20 | iii |

| | |
|---|---|
| 21 | i |
| 22 | iii |
| 23 | ii |
| 24 | i |
| 25 | ii |
| 26 | iii |
| 27 | iv |
| 28 | i |
| 29 | ii |
| 30 | iv |

| | |
|---|---|
| 31 | i |
| 32 | ii |
| 33 | ii |
| 34 | i |
| 35 | iii |
| 36 | ii |
| 37 | iii |
| 38 | iii |
| 39 | ii |
| 40 | iv |

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II**

**අ.පො.ස. (සා/ පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය (පිළිතුරු)**

**11 ශ්‍රේණිය**

1.

I.කේවල ස්වාමි ව්‍යාපාර / තනි පුද්ගල ව්‍යාපාර

II.ව්‍යවසායකත්වය

III.ශක්තිය - නිර්මාණශීලී හැකියාව ,

අවස්ථාව - පොලිතීන් හා ප්ලාස්ටික භාවිතය සීමා කිරීම

**IV. අ.**

නිෂ්පාදනය

1) ප්‍රවර්ධනය

**ආ.** ප්‍රවාහනය - ලොරිය

සන්නිවේදනය - (E- mail) විද්‍යුත් තැපැල
බැංකු ණය

V.

**අ.** සීමිත සමාගමක් ලෙස 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ යුතුය

| | | රුපියල් |
|---|---|---|
| **ආ.** | මුදල් | 100 000 |
| | උපකරණ | 10 000 |
| | හිමිකම | 110 000 |

VI. සෘජු පිරිවැය - අමුද්‍රව්‍ය ගැනුම් රු 50 000

වක්‍ර පිරිවැය - විදුලි වියදම රු 30 000

VII.

පොදු ජර්නලය

| දිනය | ජර්නල වවුචර් අංකය | විස්තරය | ස/පි | හර රු | බැර රු |
|---|---|---|---|---|---|
| | | ලොරි රථ ගිණුම | | 300 000 | |
| | | ණයහිමි ගිණුම(කුරේ සමාගම) | | | 300 000 |
| | | (කුරේ සමාගමින් ලොරි රථයක් ණයට ගැනීම) | | | |

VIII. අ.

| | | |
|---|---|---|
| මුදල් | 100 000 | |
| අත්පිට විකුණුම් | 150 000 | |
| බැංකු ණය | 200 000 | |
| | | 450 000 |
| අමුද්‍රව්‍ය ගැනීම් | 50 000 | |
| වැටුප් | 20 000 | |
| විදුලිය | 30 000 | |
| | | (100 000) |
| මුදල් ශේෂය | | රු 350 000 |

ආ. ජංගම නොවන වගකීම් - බැංකු ණය රු 200 000

ජංගම වගකීම් - ණයහිමියෝ රු 20 000

IX.

| | | |
|---|---|---|
| විකුණුම් (150 000 + 50 00) | | 200 000 |
| ගැණුම් (50 000+ 20 000) | 70 000 | |
| අවසාන තොගය | (2 000) | (68 000) |
| | | 132 000 |
| **අඩු කලා - වියදම්** | | |
| වැටුප් | 20 000 | |
| විදුලිය | 30 000 | (50 000) |
| ශුද්ධ ලාභය | | රු 82 000 |

X. අ. හිමිකම් ගිණුම - ප්‍රාග්ධන ගිණුම

ආදායම් ගිණුම - විකුණුම් ගිණුම

ආ.

| | |
|---|---|
| **ජංගම නොවන වත්කම්** | |
| උපකරණ | රු 10 000 |
| ලොරි රථය | රු 300 000 |
| | රු 310 000 |
| **ජංගම වත්කම්** | |
| ණය ගැතියෝ | රු 50 000 |

2.

I. ආ.

- ජීවත් වීමට මිනිසා විසින් අනිවාර්යෙන් ම සපුරාගත යුතු දෑ මිනිස් අවශ්‍යතා වේ.
- අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ස්වරූප වුවමනා වේ

ආ.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| 1. අනිවාර්යයෙන් සපුරා ගත යුතුය<br>2. සීමිතය<br>3. පොදුය<br>4. ව්‍යාපාරිකයාට නිර්මාණය කල නොහැක | • අනිවාර්‍යයෙන් සපුරාගත යුතු නැත<br>• සීමිත නොවේ<br>• සපුරාගන්නා ආකාරය අනුව විවිධය<br>• ව්‍යාපාරිකයාට නිර්මාණය කල හැක |

II.

අ අසත්‍ය

ආ සත්‍ය

ඇ අසත්‍ය

ඈ සත්‍ය

III. අ. ශ්‍රමය - නවීන්

ව්‍යවසායකත්වය - විකුම්

භූමිය - අලිගැට පේර ඇට

ප්‍රාග්ධනය - උපකරණ

ආ. ලාභ චේතනාව

පාරිභෝගිකයා තෘප්තිමත් කිරීම

IV. අ. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව - ලාභ අපේක්ෂා කර නොගත්

විභාග දෙපාර්තමේන්තුව - ලාභ අපේක්ෂා කර නොගත්

ආ. පැවැත්ම - ස්ථාවර පැවැත්මක් ඇත

අයිතිය - පොදු අංශය

3.

I. අ) චෙක්පත මතුපිට සමාන්තර රේඛා දෙකක් ඇඳීම

ආ) කේෂණා හිමිකම්

උපරිම විස්වාසය

හානි පූර්ණය

II.

| | |
|---|---|
| අ | සත්‍ය |
| ආ | සත්‍ය |
| ඇ | සත්‍ය |
| ඈ | අසත්‍ය |

III. අ) බැංකු අයිරාව

ආ) රු 30 000

IV. අ) හරපත් , ණයපත්

ආ) රජයේ රෝහල, රජයේ ආයුර්වේදය

4.

I. අ. ව්‍යාපාර අරමුණ අපේක්ෂිත අයුරින් ඉටුකර ගැනීමයි.

ආ.සැලසුම්කරණය

සංවිධානය
මෙහෙය වීම
පාලනය

II.

අ. සත්‍ය

ආ. සත්‍ය

ඇ. අසත්‍ය

ඈ. සත්‍ය

III. අ.

A.සංවිධනකරණය

B.සැළසුම්කරණය

C.මෙහෙයවීම

D.පාලනය

ආ. ඉලක්ක වෙළෙඳපොල

IV. අ. නිෂ්පාදිතය

මිල

ප්‍රවර්ධනය

ස්ථානය

ආ. ආයෝජනයේ අරමුණු

ආයෝජනයේ අවදානම
ආයෝජනයේ ප්‍රතිලාභ

5.

I. අ. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම.

ව්‍යාපාරයේ පාලනයට යටත් වීම.
අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම.

ආ. වත්කම් = හිමිකම් + වගකීම්

II. සුළු මුදල් පොත

සුළුමුදල් ගෙවීම් වවුචරය

III. අ.

1)රු 50 000 බැංකු ණයක් ගැනීම.

2)රු 20 000 බඩු තොගයක් ණයට ගැනීම.

3)රු 5 000 කඩ කුලී ගෙවීම

4)රු 20 000 බඩු තොග රු 25 000කට අත්පිට මුදලට විකිණීම.

ආ. මුළු වත්කම් රු 370 000

මුළු වගකීම් රු 170 000

මුළු හිමිකම රු 200 000

IV.

අ) 1. රු 50 000ක වැටුප් පොත්වලින් මගහැරීමේ වැරදි කිරීම.

2. රු 20 000ක විදුලි උපකරණ මිලදී ගැනීම විදුලි උපකරණ අළුත්වැඩියා ලෙස සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම.

ආ) 2019.08.31

| වැටුප් ගතම | |
|---|---|
| 50 000 | |

| මුදල් ගතම | |
|---|---|
| | 2019.8.31<br>50 000 |

| විදුලි උපකරණ | |
|---|---|
| 2019.8.31<br>20 000 | |

| විදුලි උපකරණ අලුත්වැඩියා | |
|---|---|
| | 8.31 20 000 |

6.

I. අ. ව්‍යාපාරය පිළියෙල කරන බැංකු ගිණුමේ ශේෂයක් බැංකුව විසින් එවන ලද බැංකු ප්‍රකාශනයේ ශේෂයක් අසමාන වූ විට බැංකු ගිණුම හා බැංකු ප්‍රකාශයේ ගණුදෙනු ගලපා වෙනසට හේතුන් සොයා සංසන්දනය කිරීමට පිළයෙල කරන විස්තරයයි.

ආ. බැංකු ගාස්තු
සෘජු ප්‍රේෂණ
ස්ථාවර නියෝග මත ගෙවීම

II. රු.

අ. 90 000
30 000
2 000
122 000

ආ. රු. 50/= (122 000 + 18 000 = 140 000 / 1400 = 100)
(150 – 100)
= 50

III. රු. 6 000

2. අ. ණයට ගැණුම් රු. 14000 ණය හිමි ගිණුමට පමණක් ඇතුලත් කිරීම.
ආ. ලද වට්ටම් රු. 6 000 ලද වට්ටම් ගිණුමෙන් මග හැරීම.
ඇ. රක්ෂණ ගාස්තු ගිණුමේ රු. 4 000 වැඩියෙන් සටහන් වීම.
ඇ. යන්ත්‍ර ගිණුමේ රු. 10 000 වැඩියෙන් සටහන් වීම.

IV.

**නාමලීගේ ව්‍යාපාරයේ 2019/08/31 න් අවසන් වර්ෂය සඳහා**

**සංශෝධිත බැංකු ගිණුම**

| | රු. | | රු. |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 21000 | බැංකු ගාස්තු | 500 |
| සෘජු ප්‍රේෂණ | 2000 | ශේෂය ප/ගෙ | 22500 |
| | 23000 | | 23000 |

නාමලීගේ ව්‍යාපෘතිය 2019 අගෝස්තු මාසය සඳහා

**බැංකු සැසඳුම් විස්තරය**

| | රු | රු |
|---|---|---|
| සංශෝධිත බැංකු ශේෂය | | 22 500 |
| එකතු කලා | | |
| ඉදිරිපත් නොකල චෙක් | | 8 000 |
| | | 30 500 |
| අඩුකලා | | |
| 2019.8.31 උපලබ්ධි නොවූ චෙක් | | (5 000) |
| බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | 25 500 |

7.

I. අ. වත්කම්

වගකීම්

හිමිකම්

ආ. බොල් ණය ගිණුම හර

ණයගැති ගිණුම බැර

II. අ.

A.රු 40 000

B.රු 50 000

C.රු 15 000

D.රු 7 000

ආ.

**උදාන ක්‍රීඩා සමාජයේ 2019/06/30 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| | | රු |
|---|---|---|
| <u>ආදායම</u> | | |
| සාමාජික ගාස්තු | | 50 000 |
| ටිකට් පත් අලෙවියෙන් ලද | | <u>15 000</u> |
| | | 65 000 |
| <u>වියදම්</u> | | |
| ගමන් ගාස්තු | 5 000 | |
| විදුලි වියදම් | 7 000 | |
| උත්සව වියදම් | <u>10 000</u> | <u>(22 000)</u> |
| අතිරික්තය | | <u>43 000</u> |

**නුවන් ව්‍යාපාරය**

**2018/12/31 න් අවසන් වර්ෂය සඳහා**

**ලාභ හෝ අලාභ ප්‍රකාශනය**

| | | | රු. |
|---|---|---|---|
| විකුණුම් | | | 120 000 |
| අඩුකලා: විකුණුම් පිරිවැය | | | |
| 2018/1/1 තොගය | | 4 000 | |
| ගැණුම් | | 80 000 | |
| ගෙන ඒමේ කුල | | 2 000 | |
| | | 86 000 | |
| අඩුකලා: 2018/12/31 තොගය | | (6 000) | (80 000) |
| දළ ලාභය | | | 40 000 |
| දළ වට්ටම් | | | 6 000 |
| | | | 46 000 |
| බෙදා හැරීමේ වියදම් | | | |
| දුන් වට්ටම් | 4 000 | | |
| බොල් ණය | 2 000 | 6 000 | |
| පරිපාලන වියදම | | | |
| වරිපනම් | 6 000 | | |
| විදුලි ගාස්තු | 5 000 | | |
| වේතන | 8 000 | | |
| ලී බඩු උපකරණ ක්ෂය | 5 000 | 24 000 | |
| මූලික වියදම් | | | |
| බැංකු ණය පොලී | 10 000 | 1 000 | (31 000) |
| ශුද්ධ ලාභය ප්‍රා/හි/මාරුකලා | | | 15 000 |

ආ.

## නුවන් ව්‍යාපාරය

## 2018/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| ජංගම නොවන වත්කම් | පිරිවැය (රු.) | සමුච්චිත ක්ෂය (රු) | ධාරණ අගය (රු) |
|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 170 000 | - | 170 000 |
| ලී බඩු උපකරණ | 50 000 | 10 000 | 40 000 |
| | 220 000 | 10 000 | 210 000 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | 6 000 | |
| ණය ගැතියෝ | | 28 000 | |
| මුදල් | | 12 000 | 46 000 |
| | | | 256 000 |
| ප්‍රාග්ධනය | | 200 000 | |
| එකතු කලා: ශුද්ධ ලාභය | | 15 000 | 215 000 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| 10% බැංකු ණය | | 10 000 | 10 000 |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියෝ | | 30 000 | 31 000 |
| උපචිත බැංකු ණය පොළි | | 1 000 | |
| | | | 256 000 |